දිනය: 2021-08-05
අංකය: 13

# <u>මාධ්‍ය නිවේදනයයි</u>
# <u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව</u>

## <u>සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සීමිත සේවාලාභීන් පිරිසක් සඳහා විදේශ ගමන් බලපත්‍ර ලබා දීම</u>

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩල නිලධාරීන් කිහිපදෙනෙකු කොවිඩ් -19 වෛරසය ආසාදනය වීම හේතුවෙන් අවම සේවක සංඛ්‍යාවක් යටතේ සේවාවන් ලබාදීමට තීරණය කොට ඇත.

ඒ අනුව සාමාන්‍ය සේවයේ යටතේ ගමන් බලපත්‍ර ලබා දීම තාවකාලිකව අත්හිටවන අතර අත්‍යවශ්‍ය සේවා අවශ්‍යතා ඇති සේවාලාභීන් සඳහා පමණක් එක් දින සේවය යටතේ ගමන් බලපත්‍ර ලබාදීම සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**වැදගත්:** ඉහත සඳහන් සියළු සේවාවන් ලබාදීම පවතින වසංගත තත්වය හමුවේ **රජය විසින් වරින්වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ, ඇඳිරි නිතිය පැනවීම්, සෞඛ්‍ය අංශ හා ආරක්ෂක අංශ තීරණයන්ට යටත් වන බවද,** ඒ අනුව සේවාව ලබාදීම පිළිබඳ තීරණ වරින්වර සංශෝධනය කිරීම් වලට යටත් වන බවද නිවේදනය කරමි.

පාලක ජනරාල්
ආගමන හා විගමන දෙපාර්තමේන්තුව